300

RARE

# ක්‍රි.ව. හයවන සියවස සිට දහතුන්වන සියවස දක්වා ශ්‍රී ලංකාව සහ බටහිර ආසියාව අතර පැවති වාණිජ සම්බන්ධතා පිලිබඳ ඓතිහාසික පර්යේෂණයක්

කේ. එම්. රෝහිත දසනායක



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 300 |
| වර්ග අංකය | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ඉතිහාසය පිලිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2004 පෙබරවාරි

# සාරාංශය

ශ්‍රී ලංකාව සහ බටහිර ආසියාව අතර පැවැති වාණිජ සබඳතා පිළිබඳ හැදෑරීම යනු හුදෙක් නව්‍යත ම වූ අධ්‍යයනයක් බව සඳහන් කළ යුතුය. එම සබඳතා ඉස්ලාම් ධර්මය බිහිවීමටත් පෙර සිට ම පැවැතුණි. ක්‍රි. ව. 6 වන සියවස අවට කාලය වන විට පෙර අපර දෙදිග වාණිජ ජාලයේ සුවිශේෂ ස්ථානයක් හිමි කර ගනිමින් ජාත්‍යන්තර වාණිජ ජාලයේ වැදගත් පාර්ශවකරුවෙකු වශයෙන් ක්‍රියාශීලීව කටයුතු කරමින් සිටීම එම තත්ත්වයට ප්‍රධාන හේතුව විය. බටහිර ආසියාවේ ප්‍රධාන බලවතෙකු වූ පර්සියන් අධිරාජ්‍යය සමග සබඳතා ඇති කර ගනු ලැබුයේ මෙම පසුබිම යටතේ ය. එසේ ම මහමද්තුමා යටතේ ඉස්ලාම් ධර්මය බිහිවීම සහ අරාබි කාලිෆ් අධිරාජ්‍යය වර්ධනය වීම ඉන්දියන් සාගරයේ වාණිජ කටයුතු කෙරෙහි බලපෑ සුවිශාල වූ ප්‍රපංචයකි. ඉන්දියානු සාගරයේ වාණිජ කටයුතු කෙරෙහි අධ්‍යයනය කළ විද්‍යාර්ථීන්ගේ අදහස වූයේ ද යථෝක්ත සංසිද්ධීන් දෙක එනම් ඉස්ලාම් ධර්මය බිහිවීම සහ කාලිෆ් අධිරාජ්‍යයේ ව්‍යාප්තිය ඉන්දියන් සාගරයේ අරාබීන්ගේ වාණිජ කටයුතුවල ප්‍රවර්ධනයෙහි ලා හේතු වූ බව ය. එහෙත් එය මතුපිටින් පෙනෙන්නා වූ ප්‍රපංචයක් පමණක් වුවත් එම තත්ත්වය අභිබවා ඉන්දියන් සාගරයේ පැවැති භෞතික පිහිටීම සහ අසීමිත සම්පත් ප්‍රමාණයක් සතුවීම යන කරුණු වැදගත් වූ බව. ශ්‍රී ලංකාව උදාහරණයක් ලෙස ගෙන පෙන්වා දිය හැකි ද යන සම්ක්ෂිත ගැටළුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරිණි.

ක්‍රි. ව. 6 වන සියවසට පෙර ශ්‍රී ලංකාව සමග පැවැති අනෙක් විදේශ වාණිජ සබඳතා පිළිබඳ සාකච්ඡා කිරීම සුවිශාල කාර්යභාරයක් වුවත් අධ්‍යයනයේ ප්‍රස්තුත කාලපරිච්ඡේදයේ වාණිජ සබඳතා නිවැරදිව තේරුම් ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ අධෝ ලිපි මගින් උපුටා දක්වමින් සංක්ෂිප්ත ව විස්තර කිරීම සිදු කර ඇත. බටහිර ආසියාව සමග සබඳතා විමසා බැලීමේ දී ඒ සඳහා මෙතෙක් සිදු වී ඇති පර්යේෂණ සහ බටහිර ආසියානුවන් ශ්‍රී ලංකාව පිළිබඳ තබා ඇති සටහන් අධ්‍යයනය

කිරීමට මූලික වශයෙන් අවධානය යොමු කෙරිණි. එසේ ම අධ්‍යයනයේ අත්‍යවශ්‍යය අංගයක් ලෙස සැලකුණු පුරාවිද්‍යාත්මක දත්ත සොයා ගැනීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණ වැදගත් කොට සැලකූ අතර එහි දී අදාල කැණීම් මධ්‍යස්ථානවල. විශේෂයෙන් අනුරාධපුර. පොලොන්නරුව ආදී ප්‍රදේශවල ගවේෂණය සහ කොළඹ. යාපහුව. වැනි කෞතුකාගාර සමීක්ෂණ යෙදීම ද වැඩි වශයෙන් උනන්දු විය. මීට අමතරව මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති මුස්ලිම් විද්වතුන්ගේ අදහස් දැන ගැනීමට ද උනන්දු වූ අතර එය වඩා වැදගත් වූයේ අරාබි සෙල්ලිපි අධ්‍යයනයේ දී හා ඉස්ලාමීය කාසි හඳුනා ගැනීම කෙරෙහි ය.

ශ්‍රී ලංකාව පර්සියාවේ අනුස්වාරන් රජුගේ කාලයේ ඇති කර ගනු ලැබූ වාණිජ සබඳතාවල ආරම්භයේ සිට ශ්‍රී ලංකාව සහ මැදපෙරදිග කලාපය අතර සබඳතාවලට අවශ්‍යය පසුබිම සැකසුණු අතර අරාබි කාලිෆ් අධිරාජ්‍යය සමග සබඳතා ඇති කර ගැනීමට ද එම තත්ත්වය හේතු විය. හරවුන් අල් රෂීඩ් රජුගේ කාලයේ සින්බැඩ් නම් නාවිකයා පැමිණීම මෙන් ම ශ්‍රී ලංකාවේ එවකටත් අරාබි වෙළෙඳුන් පදිංචි වී සිටී ම පිළිබඳ ව තොරතුරු හමු වීම ද මෙම සබඳතාවල වැදගත් පාර්ශවයක් හෙළි කර දෙයි. ඇතැම් ප්‍රවෘත්තීන් හුදු කල්පිත චරිත පමණක් නො වන බව සින්බැඩ් චාරිකාව තුළින් පෙන්වා දීමට ප්‍රයත්නයක යෙදෙන අතර පුරාවිද්‍යාත්මක දත්ත මෙන් ම සින්බැඩ් නාවික ගමන පිළිබඳ ක්ෂේත්‍ර ගවේෂණයක යෙදුණු ටිම් සොවරිංගේ පර්යේෂණ දත්තයන් ද උපයෝගී කොට ගැනීමෙන් මේ තත්ත්වය තව දුරටත් අවධාරණය කෙරේ.

ක්‍රි. ව. 9. 10 සියවස් වන විට ශ්‍රී ලංකාවට පැමිණි අරාබි වෙළෙඳුන්ගේ හා සංචාරකයින්ගේ පැමිණීමෙ සංඛ්‍යාත්මක වර්ධනයක් දක්නට ලැබුණි. ඉබන් ඛුර්දාද්බේ. අල් බලසූරි. අල් මසූදි. සුලෙයිමාන්. ඉද්‍රිසි. අල් තබරි. ඉබන් වහබ්. අල් බරූණි. වැනි බොහෝ දෙනෙක් මෙම කාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ සටහන් තබා ඇත. ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග වාණිජ ජාලයේ සුවිශේෂ ස්ථානයක පිහිටමින් වරාය පහසුකම් මෙන් ම මුතු මැණික්. ඇත් දත්. ඖෂධ. කුළුබඩු ආදී අපනයන භාණ්ඩ සම්පත් රැසකගේ තොරතුරු බොහොමයක්

සඳහන් කරනුයේ බටහිර ආසියානුවන් ශ්‍රී ලංකාව කෙරෙහි දැක් වූ සුවිශේෂ ආකල්පය නිසා ය. ශ්‍රී ලංකාව සමග ඔවුන් පවත්වා ගෙන ගිය වාණිජ සබඳතාවල බාහුල්‍යයත්වය ද ඉන් ප්‍රකට කරවයි. මෙම අරාබීන්ගේ පැමිණීමත් සමග ශ්‍රී ලංකාව මෙතෙක් පෙර අපර දෙදිග වාණිජ ජාලයේ අතරමැදියෙකු ලෙස සිදු කළ කාර්ය භාරය ගිලිහී ගිය බව ඇතැම් විද්වතුන් විසින් පෙන්වා දෙනු ලබති. එපමණක් නො ව එම අතරමැදි තත්ත්වයෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකාව ලැබූ අතිරික්ත ධනය ශ්‍රී ලංකා ආර්ථිකයේ සුවිශාල පැතිකඩක් ආවරණය කිරීමට සමත් වූ අතර වාරිමාර්ග හා සංස්කෘතික ස්මාරකයන් ඉදිකිරීමෙහි ලා එම ධනය වැය කිරීමට පෙර දී හැකි වූව ද, මෙම තත්ත්වය නිසා ශ්‍රී ලාංකිකයන්ගේ අතරමැදි කාර්ය ගිලිහී ගොස් මෙම කාලයේ ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ඉදිකිරීමෙහි ලා අහිතකර ලෙස බලපෑ බවත්, එතෙක් ශ්‍රී ලංකාව ලැබූ ලාභාංශවල පහත වැටීමක් පෙන්නුම් කරන බවත් ඔවුහු පෙන්වා දෙති. අධ්‍යයනයේ දී හමු වූ සාධක අනුව එවැනි තත්ත්වයක් දක්නට නො ලැබුණු බව පෙන්වා දීමට උත්සහ ගෙන තිබේ. තුදෙක් වෙළෙඳුන්ගේ පැමිණීම වර්ධනය වීම හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ වාණිජ නිෂ්පාදනයන් ලබා ගැනීමේ ප්‍රවණතාවයේ වැඩි වීමක් දක්නට ලැබීම සුවිශේෂ කරුණකි.

ක්‍රි. ව. 11, 12, 13 සියවස් අවට කාලයේ ශ්‍රී ලංකාව සමග බටහිර ආසියානු කලාපය අතර සබඳතා ඇති වීමේ තවත් වැදගත් අදියරක් සනිටුහන් කරයි. බැග්ඩෑඩ් කාලිෆ් අධිරාජ්‍යය කයිරෝ දක්වා විතැන් වීමත්, පර්සියන් ගල්ෆ් කලාපයේ සිදු කෙරුණා වූ වාණිජ කටයුතු රතු මුහුද කලාපයට අවතීර්ණ වීමත් අරාබි වෙළෙඳුන් ඉන්දියානු ප්‍රදේශවලට බහුල ලෙස පැමිණීමත්, මෙම කාලයේ ඉන්දියන් සාගර කලාපයේ වාණිජ කටයුතු වර්ධනය වීම කෙරෙහි තදින් බලපෑවේ ය. එසේ ම චෝළ පාලයන් ද ශ්‍රී ලංකාවේ පාලකයන් ද අග්නිදිග ආසියාවේ සහ චීනයේ දකුණු සුං අධිරාජ්‍යයේ පාලකයන් ද යන කලාපීය බලවතුන් ඉන්දියන් සාගරයේ වාණිජ කටයතුවලට ක්‍රියාශීලී ලෙස නිරත වීමත් යන සිදුවීම් මධ්‍යයේ ශ්‍රී ලංකාව සමග බටහිර ආසියානු කලාපය පැවැති සබඳතා තේරුම් ගැනීමට සිදු වේ. මුස්ලිම්වරු ශ්‍රී ලංකාව සමග සබඳතා පවත්වා ගෙන යනු ලබන්නේ මෙම

වාණිජ ජාලය සමග එකට බද්ධ වීම මගින් ය. විශේෂයෙන් වාණිජ ශ්‍රේණි සමග ( **Trade Guild** ) බද්ධ වී කටයුතු කරමින් ශ්‍රී ලංකාව සමග සබඳතා පවත්වා ගතියි. විටෙක ඔවුන් ශ්‍රී ලංකවේ රජුගේ විදේශ වෙළෙඳාමේ කටයුතු පිළිබඳ උපදේශකවරුන් ලෙස ද කටයුතු කරනු දක්නට ලැබේ. එසේ ම අරාබි ෆිටිමීඩ් කාලීවරුන් සමග කිට්ටු සබඳතා ශ්‍රී ලාංකීය පාලකයින් පවත්වාගෙන ගිය බව, ශ්‍රී ලංකාවේ හමුවන්නා වූ ඉස්ලාමීය කාසි ප්‍රමාණයෙන් ම වටහා ගත හැකිය. තව ද පළමු පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ විස්තර ඉදිරිපත් කරන ඉද්‍රිසි මෙම සබඳතා පිළිබඳ වැදගත් කොටසක් අනාවරණය කර දෙයි. ඇතැම් විද්වතුන්ගේ අදහසට අනුව ඉද්‍රිසි ආසියානු කටයුතු පිළිබඳ විස්තර දක්වන්නෙකු වශයෙන් එතරම් ප්‍රාමාණික උගතෙකු නො වන බව ය. එහෙත් අධ්‍යයනයේ දී පෙනී ගිය කරුණක් වනුයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එම අදහසට එකග විය නො හැකි බව ය. ඔහු ඉදිරිපත් කරන ලංකා සිතියම හා විස්තර ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් වඩා විශ්වසනීය තොරතුරු ලබා දෙන බව පෙනී යයි. ශ්‍රී ලංකාවේ මීට සමාකාලීනව හමුවන ඉස්ලාමීය මැටි බඳුන්, කාසි, සෙල්ලිපි හා වෙනත් පුරා විද්‍යාත්මක ආම්පන්න ඇසුරින් ශ්‍රී ලංකාව හා බටහිර ආසියානු කලාපය සමග පැවැති සබඳතා පිළිබඳ අදහස් ලබා දෙයි. තවදුරටත් ශ්‍රී ලංකාව නිෂ්පාදන අපනයන මධ්‍යස්ථානයක් ලෙසට ක්‍රියා කරමින් මෙන් ම නාවික ආම්පන්න සැපයීම අතින් ද සුවිශාල කාර්ය භාරයක් ඉටු කළ බව පෙනී යයි.

ශ්‍රී ලංකාව සහ බටහිර ආසියාව අතර වාණිජ සබඳතා තහවුරු වීම කෙරෙහි ආගමික සංකේතයක් වශයෙන් ශ්‍රී පාදය නැතහොත් ආදම්ගේ පාදය වැදගත් බලපෑමක් කළ බව හඳුනා ගත හැකිය. පර්සියානු අරාබි වාර්තාවල ශ්‍රී පාදය පිළිබඳ දක්වා ඇති විස්තරවලින් ම ඒ බව පෙනී යයි. ශ්‍රී ලංකාව කෙරෙහි ඔවුනිගේ අවධානය යොමු වීමට ආදම්ගේ පාදය පිහිටීම වැදගත් වූවා සේම, එය පිහිටි කන්ද හා ඒ අවට කලාපය මැණික් හා ඖෂධ ලබා දෙන්නා වූ ප්‍රදේශයක් ලෙස වැදගත් වීම නිසාත්, වාණිජ මෙන් ම ආගමික යන ද්විත්ව අරමුණු ඉටු කර ගැනීම සඳහා ඔවුන්ට එමගින් හැකිවීම මෙහි දී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් විය. ශ්‍රී පාද මාර්ගයේ හමු වන්නා වූ අරාබි අභිලේඛනය මගින්

සහ ඉබන් ඉතුනා දක්වන විස්තරවලින් මෙම සබඳතා පිළිබඳ වැදගත් පාර්ශවයක් අනාවරණය කර දෙයි.